**උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා තෝරා පත් කර ගැනීම - සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ නිර්නායක**

| මාතෘකාව | |
|---|---|
| **01. ජ්‍යෙෂ්ඨතාවය**<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් වීමෙන් පසු එක් වසරකට ලකුණු 3 බැගින් (උපරිම වසර 10ක් දක්වා)<br>(ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් වීමෙන් පසු මාස 06 හෝ මාස 06ට වැඩි, වසරට වඩා අඩු - ලකුණු 0.5 බැගින්) | 30 |
| **02. ක්ෂේත්‍රයේ/ක්ෂේත්‍රවල පළපුරුද්ද**<br>2.1. අධ්‍යාපන සංවර්ධනය සඳහා සිදුකරන ලද ව්‍යාපෘති එකකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 02 ක් සඳහා උපරිම ලකුණු 04 (මෙම ව්‍යාපෘති විධිමත් අනුමැතියක් සහිතව නිලධාරියා සෘජු දායකත්වයක් දක්වා ඇති ව්‍යාපෘති විය යුතු අතරම ව්‍යාපෘති වාර්තාව, කාල රාමුව සහ ව්‍යාපෘතියේ ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය)<br>2.2. සේවා පළපුරුද්ද<br>අදාළ පත්වීම් බලධාරීන් විසින් නිකුත් කර ඇති විධිමත් පත්වීම් ලිපි සඳහා පමණක් උපරිම ලකුණු සීමාවට යටත්ව ලකුණු ලබා දෙනු ලැබේ.<br>**I.** පාසල් කළමනාකරණයේ පළපුරුද්ද<br>(ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා අනුමත විදුහල්පති තනතුරක එක් වසරකට ලකුණු 01 බැගින් වසර 03ක් සඳහා ලකුණු 03)<br>**II.** කාර්යාල කළමනාකරණයේ පළපුරුද්ද<br>(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ<br>වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින් උපරිම වසර 8ක් සඳහා ලකුණු 08 | 15 |
| 03. වෘත්තීය සුදුසුකම්/පර්යේෂණ නවෝත්පාදන (3.1, 3.2, 3.3, 3.4 හා 3.5 සඳහා ඉහළම සුදුසුකම් සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ)<br>3.1. අධ්‍යාපන සුදුසුකම්<br>(අදාළ සේවා ව්‍යවස්ථාවේ/බඳවා ගැනීම් පටිපාටියෙහි විශේෂයෙන් දක්වා ඇති ක්ෂේත්‍ර/විෂයන් අතරින් අදාළ ක්ෂේත්‍රය තෝරන්න)<br>a) දර්ශනශූරි උපාධි (PhD) - ලකුණු 08<br>b) දර්ශනපති උපාධි - ලකුණු 06<br>c) පළමු පංතිය/ ශ්‍රේණියට උසස්වීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි(MA, MSc, MBA වැනි) - ලකුණු 05<br>d) කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමේදී සලකා නොබැලූ පශ්චාත් උපාධි - ලකුණු 04<br>e) සේවයට බඳවා ගැනීමට සුදුසුකම වූ ප්‍රථම උපාධියට අමතරව ලබා ඇති ප්‍රථම උපාධි - ලකුණු 03<br>සටහන : බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ ශ්‍රේණි උසස්වීම් සඳහා හෝ මූලික සුදුසුකමක් ලෙස අදාළ කර ගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 25 |

3.2. පර්යේෂණ හා නවෝත්පාදන

a) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළ වූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ පත්‍රිකා - ලකුණු 04

b) පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළවූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියැවුනු පර්යේෂණ පත්‍රිකා - ලකුණු 03

c) වැඩ වපසරිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලද නව්‍යකරණ/ තොරතුරු තාක්ෂණික සැලසුම් සංවර්ධනය - ලකුණු 02

සටහන : මේ සඳහා 2.1 හි සලකා බැලූ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

3.3. අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රය තුළ පුහුණුව

(මෙම පුහුණුව අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විෂයානුබද්ධ පුහුණුවක් විය යුතුය, අදාළ නිලධාරියාගේ පත්වීම හා රාජකාරියට අදාළ විය යුතුය, එම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය)

a) මාස 03 ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 05

b) දින 10 ත් මාස 03ත් අතර කාලයක - ලකුණු 03

c) දින 03 ත් දින 10 ත් අතර කාලයක - ලකුණු 02

සටහන : ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවාරම්භක පුහුණු සහතිකය, අධ්‍යාපන කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලා සහතික සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

3.4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය

a) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් - ලකුණු 04 (වසරක් හෝ ඊට වැඩි කාලයක්)

b) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර පාඨමාලාව - ලකුණු 03 (මාස 06ක් හෝ ඊට වැඩි කාලයක්)

සටහන : මෙය අතිරේක සුදුසුකමක් ලෙස සලකා බලන අතර, මුල් පත්වීම ලබා ගැනීම සඳහා ලබා ගත් සුදුසුකමක් නොවිය යුතුය.

3.5 තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාවය

මෙම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් සපුරා තිබිය යුතුයි.

a) තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් - ලකුණු 04 (වසරක් හෝ ඊට වැඩි කාලයක්)

b) තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව - ලකුණු 03 (මාස 06ක් හෝ ඊට වැඩි කාලයක්)

සටහන : මෙය අතිරේක සුදුසුකමක් ලෙස සලකා බලන අතර, මුල් පත්වීම ලබා ගැනීම සඳහා ලබා ගත් සුදුසුකමක් නොවිය යුතුය.

| | |
|---|---|
| **4. සේවා ඇගයීම්/ප්‍රශංසා සහතික (පොදු 230 බී ආකෘතිය) සම්මාන සහතික/ජයග්‍රහණ**<br>a)ජාතික මට්ටම - (ලකුණු 10 බැගින් 01ක් පමණක් සළකනු ලැබේ)<br>b)පළාත් මට්ටම - (ලකුණු 04 බැගින් 02ක් පමණක් සළකනු ලැබේ)<br>c)කලාප මට්ටම - (ලකුණු 03 බැගින් 02ක් පමණක් සළකනු ලැබේ) | 10 |
| **5. චර්යාත්මක නිපුණතා**<br>අයදුම්කරු විසින් දැනට සේවය කරනු ලබන සේවා ස්ථානයට අදාළව ආයතනයේ අරමුණු සාක්ෂාත් කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන වැඩ පිළිවෙල ඉදිරිපත් කිරීමට දෘඩ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05 ක වාචික ඉදිරිපත් කිරීමක් Power Point Presentation ඇසුරෙන් සිදු කළ යුතුයි. ඒ සඳහා පහත කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>I. කාල කළමනාකරණය - ලකුණු 3<br>II. සන්නිවේදන කුසලතාවය - ලකුණු 4<br>III. අන්තර්ගතය (ආයතනයේ අරමුණු, යෝජනා) - ලකුණු 5<br>IV. සමස්ථ ඉදිරිපත් කිරීම - ලකුණු 5<br>V. පෞරුෂත්වය - ලකුණු 3 | 20 |

සටහන 1- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2025 හා 2025.09.30 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිදි ඉහත ලකුණු පටිපාටියේ "පිළිගත් විශ්ව විද්‍යාලයක්" ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ඇති විශ්ව විද්‍යාලයකි.

සටහන 2 - ඉහත ලකුණු දීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියළු පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඒවා විය යුතු අතර, උපාධි ප්‍රදානය කරන වෙනත් ආයතනවලින් ලබාගත් එවැනි සුදුසුකම් වේ නම් ඉහත කොමිෂන් සභාවේ පිළිගැනීම ලද ඒවා විය යුතුය.

**කේ.එම්.එච්.එස්.කේ.ජයලත්**
ලේකම්
උතුරු මැද පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන,
විශේෂ ව්‍යාපෘති, සංචාරක, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.